# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2013 සැප්තැම්බර් මස 03 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.46 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**පැමිණීම :**

| | |
|---|---|
| ගරු අයි.ඒ. සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බල ශක්ති සහ වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා) |
| ගරු ජගත් අංගගේ | (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා) |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අමරසේකර, ශිරන්ත | ජයවර්ධන, නිහාල් | මැන්දිස්, සුමිත් ලාල් |
| අම්ජාඩ්, එම්.එම්.එම්. | තිලකරත්න, හෂාන් | යූසුෆ්, ඒ.එම්. |
| අල්මේදා, මහේෂ් | තිලකසිරි, ගාමිණී | රහුමාන්, මොහොමඩ් මුජිබර් |
| උඳුගොඩ, ප්‍රදීප් | ද සිල්වා, ගාමිණී | රාජපක්ෂ, තිලකරත්න |
| එල්ලාවල, ලලිත් | ද සිල්වා, ජයන්ත | රාම්, පංචරත්නම් |
| කාරියවසම්, කීර්ති | ද සිල්වා, පියල් නිශාන්ත | ලංකාතිලක මැතිනිය, අශෝකා |
| කුමාර, ජගත් | ද සිල්වා, සිරිකමල් ෆිලීෂියන් | වනිගරත්න, ලලිත් |
| කුරුප්පු, කාමල් | පතිරණ, සරත් | වර්ණකුමාර, ලලිත් |
| කුරුවිටගේ, මහින්ද | පියනන්ද ස්ථවිර, පූජ්‍ය තෙඹුවන | වැලිවත්ත, ජනක් දීපාල් |
| කුලරත්න, ලාල් | පාදුක්ක, නිරෝෂන් | විජයරත්න, මොරිස් |
| කොටකදෙනිය, එච්.එම්.ජී.බී. | පෙරේරා, දයාකාන්ත | විජේසුන්දර, ශාලිත |
| කොස්තා, ජේම්ස් ප්‍රිමිලස් | පෙරේරා, පෝල් | විජේසේකර, රවී |
| කෝරළගේ, යසපාල | පෙරේරා, මෙරිල් | සරණලාල්, චන්ද්‍රසෝම යූ.ජී. |
| ගුණසේකර, විකුම් | ප්‍රනාන්දු, කිත්සිරි | සුමනසේකර, සරත් කුමාර |
| චන්ද්‍රභානු, අධිකාරම්ගේ | ප්‍රනාන්දු මැතිනිය, රෝස් | සූරියබණ්ඩාර, ජානක |
| චන්ද්‍රරත්න, නිමල් | බෙත්මගේ, හෙක්ටර් | සෙනෙවිරත්න, රොජර් |
| ජයකොඩි, සිසිර | මතුගමගේ, සුගත් | ෆයිරූස්, මොහොමඩ් |
| ජයතිස්ස, නලින්ද | මල්ලව, නෙලුක් | ෆවුසි එම්. නවුසර් |
| ජයනාත්, ගුණසිරි | මංචනායක, කිත්සිරි | ෆායිස්, මොහොමඩ් |

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අබේරත්න, පී.ඩී. | ද සොයිසා, විජයමුණි සුමිත් | රාජපක්ෂ, දිලිප් කුමාර |
| උඩවත්ත, කීර්ති | දේවප්‍රිය, ඉසුර | රාජපක්ෂ, වරුණ දීප්ති |
| කහටපිටිය, කිත්සිරි | නිසාම්ඩීන්, එම්. අර්ෂාද් | රාජේන්ද්‍රන්, එස්. |
| කාරියවසම්, ලයනල් | පීරිස්, නිමල් ආර්. | රූපසිංහ, ආනන්ද රංජිත් |
| කුමරගුරුබරන්, එන්. | පෙරේරා, තුෂාර | රොද්‍රිගු, රන්දීර් |
| ගමගේ, සලෝචන | පෙරේරා, අ. ශ්‍රීනාත් ම. | ලක්තිලක, ශිරාල් |
| ගුණරත්න, උපාලි | පෙරේරා, ප්‍රදීප් | වරාගොඩ, රෙහෙන්සිරි |
| ගුණවර්ධන මැතිනිය, කෝකිලා හර්ශනී | පෙරේරා, ශ්‍රීනාත් | විජේමාන්න, ලක්ෂ්මන් |
| ජයකොඩි, චන්දන | ප්‍රියන්ත, විජිත් | විජේරත්න, උදේන |
| ජයසිංහ, ලයනල් | මවුජුඩ්, අජ්මාල් | සකළසූරිය මැතිනිය, චන්ද්‍රිකා ගුණවර්ධන |
| ද සිල්වා, අනන්ද හරිශ්චන්ද්‍ර | රහීම්, එම්.එස්.එම්. | සිරිවර්ධන මැතිනිය, සන්ධ්‍යා |
| ද සිල්වා, සේනක දමයන්ත | රාජකරුණා, හර්ෂණ | සිල්වා, අමල් |

## 01. නිවේදන :

*i*

***කාරක සභා වාර්තා නිවැරදි කිරීම :***

*"2013.07.23 දින ප්‍රඥප්ති හා නීති කාරක සභා රැස්වීම් වාර්තාවේ, "පානදුර ප්‍රාදේශීය සභාව" සහ "පානදුර ප්‍රාදේශීය සභාවේ" යනුවෙන් සඳහන් සියලු තැන් හි පිළිවෙළින් "පානදුර නගර සභාව" හා "පානදුර නගර සභාවේ" යනුවෙන් නිවැරදි විය යුතු බවත්,*

*ii*

*උතුරු පළාත් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කණ්ඩායමක් මෙම පළාත් සභාවේ වැඩ කටයුතු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා අද දින මෙහි පැමිණි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා පිළිගැන්වීම :

පහත සඳහන් කාරක සභා වාර්තා ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

i. 2013.07.30 දින පැවති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව.
ii. 2013.08.19 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

## 03. පළාත් සභාවේ රැස්වීම :

2013.08.19 දින පැවැති සභා කටයුතු කාරක සභාවේ තීරණය පරිදි 2013.09.17 දින රැස්වීම නොපැවැත්වීමටත්, එය 2013.09.24 පෙ.ව. 09.30 ට රැස් විය යුතු යැයි ජගත් අංගගේ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් කරන ලද යෝජනාව සභා සම්මත විය.

## 04. පළාත් සභාවේ කටයුතු :

ජගත් අංගගේ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද, *"අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ ඇති කාර්යයන්හි අනුපිළිවෙළ පිළිවෙළින් අංක 06, 07, 01, 02, 03, 04 හා 05 වන පරිදි සංශෝධනය විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය"* යන යෝජනාව සභා සම්මත විය.

## 05. ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා : අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද, *"අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ, ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා"* [1] නම් වූ අතුරු ව්‍යවස්ථාවන්, සභා සම්මත විය.

## 06. කුලී ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා : කඩුවෙල මහ නගර සභාව

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද *"කඩුවෙල මහ නගර සභාව විසින් සාදන ලද කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ කුලී ත්‍රී රෝද රථ නවතා තැබීම, විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා"* [2] නම් වූ අතුරු ව්‍යවස්ථාවන් සභා සම්මත විය.

## 07. ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා : කළුතර ප්‍රාදේශීය සභාව

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද කළුතර ප්‍රාදේශීය සභාවේ - *"ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා"* [3] නම් වූ අතුරු ව්‍යවස්ථාවන්, සභා සම්මත විය.

---

[1] 2013.09.03 වන දින නිල වාර්තාව බලන්න.
[2] - එම -

## 08. නගර සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව :

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද *"නගර සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා" [4] නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,* සභා සම්මත විය.

## 09. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව :

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද *"ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" [5] නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,* සභා සම්මත විය.

## 10. ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව : පානදුර නගර සභාව

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද *පානදුර නගර සභාවේ - "ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා" [6] නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,* සභා සම්මත විය.

***2013 අංක ......... දරන බස්නාහිර පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය දෙවනවර කියැවීම සඳහා ඊළඟ සභාවට ඉදිරිපත් කිරීමට සභාවෙන් අවසර ඉල්ලා සිටින ලදුව, සභාව එකඟ වූයෙන්, මීළඟ සභාවට ඉදිරිපත් කිරීමට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

***න්‍යාය පත්‍රයේ අංක XII යටතේ ඇති පෞද්ගලික මන්ත්‍රී යෝජනාවන් ලබන සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් යෝජනා කරන ලදුව, සභාව එකඟ වූයෙන්, එකී යෝජනාවන් ලබන සභාවට ඉදිරිපත් කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

## 11. කල් තැබීමේ යෝජනාව :

උදය ප්‍රභාත් ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුය."*

***ඊට අනුකූලව පළාත් සභාව, පූ.භා. 10.28 ට, 2013 සැප්තැම්බර් මස 24 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.09.04
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පූර්/04
Minuts 2013.09.04 - Hansard Section

---

[3] - එම -
[4] 2013.09.03 වන දින නිල වාර්තාව බලන්න.
[5] - එම -
[6] - එම -